සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

**33 S I**

පැය දෙකයි
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

- ✳ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ✳ අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- ✳ සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
- ✳ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ✳ **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : ..............................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?

(1) නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
(2) සෑම කාලච්ඡේදයකම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම.
(3) ගනුදෙනු සහ සිද්ධි මූල්‍ය තොරතුරු බවට පරිවර්තනය කිරීම.
(4) සැලසුම් කිරීම සහ පාලනය සඳහා කළමනාකරුවන්ට තොරතුරු සැපයීම.
(5) බාහිර ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම. (.....)

**2.** ආයතනයක ව්‍යාපාර කටයුතු හේතුවෙන් වායු දූෂණය වීම මූල්‍ය ප්‍රකාශනවල **හඳුනා නොගැනීමට** පහත කුමන ගිණුම්කරණ සංකල්පය හේතු වන්නේ ද?

(1) උපචිත (2) මූල්‍ය මිනුම් (3) ප්‍රමාණාත්මක බව
(4) විචක්ෂණ (5) ගැළපුම් (......)

**3.** ආයතනයක වර්ෂ අවසානයේදී අඩමාණ ණය වෙන් කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්ප **පදනම** සපයනු ලබයි ද?

(1) උපචිත සහ ප්‍රමාණාත්මක බව (2) ව්‍යාපාර ඒකක සහ යථාරූපී (3) ගැළපුම් සහ විචක්ෂණ
(4) කාලච්ඡේද සහ සංගතතා (5) විචක්ෂණ සහ මූල්‍ය මිනුම් (......)

● **අංක 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත මිහිරානි පොදු සමාගම මෝටර් රථ වෙළෙඳ සමාගමකි. මෙම සමාගම විසින් රු.මිලියන 10 ක මෝටර් රථ 2022.01.01 දින ණයට මිල දී ගන්නා ලද අතර, එයින් පිරිවැය රු.මිලියන 2 ක් වූ මෝටර් රථයක් කාර්යාල කටයුතු සඳහා තබාගන්නා ලදී. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය රු. 100 000 ක් විය. ඉතිරි මෝටර් රථ අලෙවි කිරීම සඳහා තබාගන්නා ලද අතර, ඉන් පිරිවැය රු.මිලියන 3 ක් වූ මෝටර් රථයක්, රු.මිලියන 4 කට 2022.03.31 දින අත්පිට මුදලට විකුණන ලදී.

**4.** මෝටර් රථ මිල දී ගැනීම සහ මෝටර් රථය විකිණීම සටහන් කිරීම සඳහා පහත කුමන මූලික සටහන් පොත් භාවිත කරනු ලබයි ද?

| | **මිල දී ගැනීම** | **විකිණීම** |
|---|---|---|
| (1) | පොදු ජර්නලය | මුදල් ලැබීම් ජර්නලය |
| (2) | මුදල් ගෙවීම් ජර්නලය | පොදු ජර්නලය |
| (3) | ගැනුම් ජර්නලය | විකුණුම් ජර්නලය |
| (4) | මුදල් ගෙවීම් ජර්නලය සහ පොදු ජර්නලය | විකුණුම් ජර්නලය සහ පොදු ජර්නලය |
| (5) | ගැනුම් ජර්නලය සහ පොදු ජර්නලය | මුදල් ලැබීම් ජර්නලය |

(......)

[දෙවැනි පිටුව බලන්න.